ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1978/31 - 2016 අගෝස්තු මස 04 වැනි බ්‍රහස්පතින්දා - 2016.08.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*යොමු අංකය* : ව/18/81/2007.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර* :

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රාගම් පත්තුව සුළු කොට්ඨාශයේ, අංක 168බී දික්ඕවිට ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ, දික්ඕවිට ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක ගම් 3014 සහ 2008.05.22 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 2 සහ 3න් පෙන්නුම් කරන මුළු ප්‍රමාණය වන හෙක්ටයාර් 0.6774 ක් පමණ වූ පහත විස්තර සඳහන් ඉඩම් කැබැල්ල. (කැබලි අංක 1 යන්න කැබලි අංක 3 සහ 4 ලෙස සංශෝධනය වී ඇති අතර කැබලි අංක 4 අවසතු කර ඇත)

01. කැබලි අංක 2

ඉඩමේ නම: සී. එස්. වත්ත *නොහොත්* කේ. කේ. මහාදේවන් වත්ත *නොහොත්* ජාවගෙවත්ත; විස්තරය: වගුරුබිම; හිමිකම් කියන අය : සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්. 0.0003.

02. කැබලි අංක 3

ඉඩමේ නම: සී. එස්. වත්ත *නොහොත්* කේ. කේ. මහාදේවන් වත්ත *නොහොත්* ජාවගෙවත්ත; විස්තරය: ගෙවත්ත සහ වගුරු බිම; හිමිකම් කියන අය : රජය; මුල් හිමිකම් කියන්නා : කොළඹ 2, චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවතේ අංක 65/19 හි පදිංචි දේවේන්ද්‍ර මහදේවන් ; ප්‍රමාණය: හෙක්. 0.6771.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2016 අගෝස්තු මස 31 වැනි දින පෙ.ව. 10.00 ට වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු යි.

තව ද, 2016 අගෝස්තු මස 31 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

ඩබ්ලිව්. ජී. ප්‍රේමලාල්,
ප්‍රාදේශීය ලේකම්,
වත්තල.

2016 අගෝස්තු මස 02 වැනි දින,
වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08 - 528

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A - G 23976 - 17 - (2016/08)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.